# විශේෂ නිවේදනයයි

## විශේෂ ගුවන් යානය මඟින් ශ්‍රී ලංකාව වෙත පිටත්වීම

ඊශ්‍රායලයේ වාසය කරන නැවත ශ්‍රී ලංකාව වෙත පිටත්ව යැමට මේ වන විටත් ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ලියාපදිංචි වී සිටින සියලුම ශ්‍රී ලාංකික ප්‍රජාව වෙතයි,

උක්ත කරුණ සම්බන්ධයෙන් මෙම තානාපති කාර්යාලය මඟින් **2020.08.20 හා 2020.08.21 දිනැතිව නිකුත් කරන ලද නිවේදන වලට වැඩිමනත් වශයෙනි.**

**ඒ අනුව කොරෝනා වසංගත තත්වය හේතුවෙන් නැවත ශ්‍රී ලංකාව වෙත පිටත්වීමට ලියාපදිංචි වී සිටින ඔබ සැම රැගෙන යාම සඳහා 2020.08.30 දින රාත්‍රී 10.00 ට අදාල විශේෂ ගුවන් යානය බෙන් ගුරියන් (Ben Gurion) ගුවන් තොටුපලින් පිටත්ව යාමට නියමිතව ඇති බැවි ඔබ සැම දන්නා කරුණකි.**

ඒ අනුව මෙම තානාපති කාර්යාලය මඟින් 2020.08.20 දින නිකුත් කරන ලද නිවේදනයේ සඳහන් කල පරිදි ඔබ හට කොරෝනා වෛරසය ආසාදනය වී නොමැති බව තහවුරු කිරීම **සඳහා ගුවන් ගමනට ප්‍රථම පැය 72 ක් ඇතුලත PCR පරීක්ෂණය සිදු කර එම වාර්තාව ගුවන් යානා කාර්ය මණ්ඩලයට ඉදිරිපත් කල යුතු හෙයින් ඒ සඳහා ඔබ 2020.08.27 වන බ්‍රහස්පතින්දා දින PCR පරීක්ෂණය සඳහා සාම්පල් ලබා දී එම PCR පරීක්ෂණ ප්‍රථිඵල ලේඛනය ඉංග්‍රීසි භාෂාවෙන් ලබා ගෙන එහි පිටපතක් 2020.08.28 දින සවස 6.00 ට පෙර මෙම තානාපති කාර්යාලයේ** slemb.telaviv@mfa.gov.lk **විද්‍යුත් තැපැල වෙත යොමු කරන මෙන් දැනුම් දෙනු ලැබේ.**

**එම PCR පරීක්ෂණ වාර්තාව පදනම් කරගෙන 2020.08.30 වන දින ගුවන් ගත වන මඟීන්ගේ අවසන් ලේඛනය මෙම තානාපති කාර්යාලය මගින් ශ්‍රී ලංකාවේ අදාල බලධාරීන් වෙත ඉදිරිපත් කර ඒ සඳහා අවසන් අනුමැතිය ලබා ගැනීම සඳහා එම ලේඛනය 2020.08.28 (සිකුරාදා) දිනය ඇතුලත ශ්‍රී ලංකාවට යැවීමට නියමිත බැවින් 2020.08.28 (සිකුරාදා) දින සවස 6.00 ට පසුව ලැබෙන PCR පරීක්ෂණ වාර්තා හිමි අයගේ නම් ගුවන් මඟීන්ගේ අවසාන ලේඛනයට ඇතුලත් කල නොහැකි වන බැවින් 2020.08.30 වන දින විශේෂ ගුවන් යානය මඟින් ගුවන්ගත වීමට ඔවුන් හට ශ්‍රී ලංකාවේ බලධාරීන්ගේ අවසරය නොලැබෙනු ඇත.**

එසේම PCR පරීක්ෂණය සිදු කර ගැනීම සම්බන්ධයෙන් මෙම තානාපති කාර්යාලය විසින් 2020.08.20 දින නිකුත් කරන ලද නිවේදනයේ සඳහන් ක්‍රම වේදයන්ට අමතරව එම PCR පරීක්ෂණය සඳහා 2020.08.26 වන බදාද දින **එනම් PCR පරීක්ෂණය සිදු කර ගැනීමට පෙර දින පහත සඳහන් දුරකතන අංක මගින් ඉකිලෝ රෝහල (Ichilov Hospital) හෝ චයිම් ෂිබා මෙඩිකල් සෙන්ටර් (Chaim Sheba Medical Center) අමතා ඔබගේ සම්පූර්ණ නම විදේශ ගමන් බලපත්‍ර අංකය සහ ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනය (e-mail) අදාල ආයතනයට ලබා**

දීමෙන් පසු **2020.08.27** දින අදාල PCR පරීක්ෂණය සිදුකර ගැනීමට අවස්ථාව ලැබෙන අතර **එසේ සිදු කරන PCR පරීක්ෂණ වල ප්‍රතිඵල 2020.08.28 දින සවස 6.00 ට ප්‍රථම ලබා දීම සම්බන්ධයෙන්ද** සම්බන්ධයෙන් තානාපති කාර්යාලය විසින් අදාල රෝහල් කාර්ය මණ්ඩල සමග සාකච්ඡා කර එකඟතාවයට පැමිණෙන ලදී.

| | රෝහල / වෛද්‍ය සායනයේ නම හා ලිපිනය | ඇමතිය යුතු පුද්ගලයාගේ නම සහ දුරකථන අංකය | PCR පරීක්ෂණය සඳහා යා යුතු දිනය සහ වේලාව | පරීක්ෂණය සඳහා වැය වන මුදල (NIS ) |
|---|---|---|---|---|
| 1 | ඉකිලෝ රෝහල (Ichilov Hospital) | Ms. Ela Joseph 052-8907593 | 2020.08.27 ප.ව. 2.00 සිට 5.00 දක්වා | 455/- |
| 2 | The Center Geographical Medicine & Tropical Diseases, Department of Medicine C, The Chaim Sheba Medical Center, Tel Hashomer 52621. | Mr. Yako 035-308456 | 2020.08.27 ප.ව. 1.00 සිට 2.00 දක්වා | 600/- |

**එසේම ඔබගේ කැමැත්ත මත වෙනත් ඕනෑම ආයතනයකින් වුවද PCR පරීක්ෂණය කර ගැනීමේ** හැකියාව ඔබ සතු වන බව අවධාරණය කරනු ලැබේ.

**එමෙන්ම ඔබ හට කොරෝනා වෛරසය ආසාදනයවී නොමැති බව සනාථ කෙරෙන, වෛද්‍ය සායනය මඟින් නිකුත් කරන ලද PCR පරීක්ෂණ වාර්තාව ඊශ්‍රායලයේ සහ ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපල කාර්ය මණ්ඩලය වෙත ලබා දීමට සිදුවන බැවින් 2020.08.30 දින සිය රට බලා යන අවස්ථාවේදී ද එම PCR පරීක්ෂණ වාර්තාවේ පිටපත් 2 ක් (ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරන ලද පිටපතක්ද සහිතව) ඔබ සතුවද තබා ගන්නා මෙන් දන්වා සිටිනු ලැබේ.**

ඉහත සඳහන් කරන ලද කරුණු සම්බන්ධයෙන් වැඩි දුර පැහැදිළි කර ගැනීමක් අවශ්‍ය වේ නම් පහත සඳහන් ජංගම දුරකතන අංක අමතන මෙන් දන්වා සිටිනු ලැබේ.

1. එච්. එච්. රුවන් වික්‍රමසිංහ - දෙවන ලේකම් - 0547215815
2. කේ. පී. චන්ද්‍රතිලක - පරිවාර නිලධාරී - 0586875764

**ශ්‍රී ලංකා තානාපති කාර්යාලය**
**ටෙල් අවිව් ඊශ්‍රායලය**

**2020.08.23**